ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 ජූනි 28 වැනි දින |

**2013 ජූනි මාසයේ දී උද්ධමනය පහළ යයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 7.3 හි සිට 2013 ජූනි මාසයේ දී සියයට 6.8 දක්වා පහළ වැටිණි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය ද පූර්ව මාසයෙහි වාර්තා කළ සියයට 8.8 හි සිට 2013 ජූනි මාසයේ දී සියයට 8.6 දක්වා පහළ වැටිණි.

මූලික උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍ය යන දෙයාකාරයෙහි ම පදනම මත පිළිවෙළින් මැයි මාසයේ පැවති සියයට 5.7 හි සහ සියයට 6.6 හි සිට 2013 ජූනි මාසයේ දී පිළිවෙළින් සියයට 4.3 සහ සියයට 6.4 දක්වා පහළ වැටිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 මැයි මාසයේ පැවති 173.9 හි සිට 2013 ජූනි මාසයේ දී 176.5 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 1.5 කින් ඉහළ නැගිණි. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 3.2 කින් ඉහළ යාම දර්ශකයේ මෙම මාසික වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර කාණ්ඩය තුළ බොහොමයක් එළවළු හා නැවුම් මත්ස්‍ය වර්ග, බිත්තර, රතු ළූණු, ලොකු ළූණු, අර්තාපල්, පොල්, අමු මිරිස් සහ දෙහි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුව ද, බොහෝ පළතුරු වර්ගවල මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ, විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 0.5 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.4 කින්); සෞඛ්‍ය (සියයට 0.1 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන්වල සුළු ඉහළ යාම් වාර්තා විය. කෙසේ වුවද, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.5 කින් පහළ ගියේය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ප්‍රවාහන; සන්නිවේදන; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.